# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/56 – 2019 නොවැම්බර් 29 වැනි සිකුරාදා – 2019.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත් සතර සුළු කොට්ඨාසයේ, වේරගම්පිට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/එම්ටීආර්/2018/171 හා 2018.07.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මතුගලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0759 ක් පමණ

උතුරට: ලීලසේන දළදවත්ත හිමිකම් කියන මතුගලකුඹුර සහ නිල්වලා ගඟ; නැගෙනහිරට: නිල්වලා ගඟ සහ ලීලසේන දළදවත්ත හිමිකම් කියන මතුගලකුඹුර; දකුණට: ලීලසේන දළදවත්ත හිමිකම් කියන මතුගලකුඹුර සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ ලීලසේන දළදවත්ත හිමිකම් කියන මතුගලකුඹුර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්එස්/543.
2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 509